# 'ඉස්කෝලෙ මහත්තයා' පරිවර්තිත නවකතාවෙන් නිරූපිත පීඩිත පන්තියේ අරගලය

*සුදේශ් කවීශ්වර* [1]

බෙංගාලි බසින් නිර්මාණකරණයේ යෙදුණු **මහාශ්වේතා දේවී** නම් ඉන්දියානු ලේඛිකාව ඉන්දියානු ජනගහනයෙන් දහයෙන් එකක් පමණ වන එරට පීඩාවට පත් ආදිවාසී, කුලහීන ගෝත්‍රික ජනයාට සිදුවන සමාජ අසාධාරණකම්වලට හා කෙනෙහිලිකම්වලට එරෙහිව අරගල කළාය. විශේෂයෙන්ම බෙංගාලයේ ලෝධා සහ ශබර් යන ආදිවාසී කණ්ඩායම්ද බිහාර්, මධ්‍යප්‍රදේශ් සහ ඡත්තීස්ගඪ් යන ප්‍රාන්තවල විසූ ආදිවාසී කණ්ඩායම්ද ඊට අයත් විය. ඇය විසින් රචිත '**මාස්ටර් සාබ්**' නවකතාව මගින් ඉඩම් හිමි ධනපති පන්තිය විසින් ගොවියන්ට එල්ල කරන තාඩන-පීඩන නිරූපණය කෙරෙයි. එය '**ඉස්කෝලෙ මහත්තයා**' නමින් මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ විසින් හින්දී බසින් සිංහලට පරිවර්තනය කරන ලදි. තත් නවකතාවෙන් නිරූපිත ගොවි ජනයාගේ අරගලය පිළිබඳව න්‍යායාත්මක විමර්ශනයක නිරතවීම මගේ අරමුණ වේ. නිවසට පැමිණෙන ඉඩම් අයිතිකරුවන්ට ස්ත්‍රීන් හා දූවරුන් බාරදී සැමියා හෝ පියා හෝ පැළදොරින් පිටමන් විය යුතු විය. මූල්‍යමය, මානසික හා ලිංගික සූරාකෑම් නිසා වධ වේදනා විඳින ගොවියෝ ධනපති පන්තියට එරෙහිව ආයුධ ගනිති. ඉස්කෝලෙ මහත්තයා (කතා නායකයා) ඊට මූලිකත්වය ලබා දෙන්නේය. නැක්සලයිට් ව්‍යාපාරයේ ඇරඹීම මෙහි විශේෂ අවස්ථාවකි. මාක්ස්වාදී න්‍යායන්ගෙන් පිළිබිඹු වන අධස්ථව්‍යුහය හා උපරිව්‍යුහය (Base and Superstructure) අතර පවතින සම්බන්ධය මනාසේ කතාව මගින් විශද වෙයි. තද් සම්බන්ධය හේතුකොට ගෙන නිෂ්පාදන සබඳතා පිළිබඳව සවිඥානකත්වයට පත්වන ගොවියන් පීඩාකාරී යදම පුපුරුවා දමන ආකාරය මේ වෘත්තාන්තයෙන් පැහැදිලි වන්නේ කෙසේද යන්න මගේ පර්යේෂණ ගැටලුවයි. මෙහිදී නැක්සලයිට් ව්‍යාපාරය කෙතරම් සාර්ථක වන්නේද යන වග විභාග කෙරේ.

**ප්‍රමුඛ පද:** අධස්ථව්‍යුහය හා උපරිව්‍යුහය, පන්ති අරගලය, නැක්සලයිට් ව්‍යාපාරය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) සාහිත්‍ය විචාරය, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*sdkaweeshwara@gmail.com*